052909
2015/07/21
ML/PR
D - 823

# වලපනේ ප්‍රදේශයේ අප්‍රචලිත ජනශ්‍රැති

# හා සමාජය

ඩබ්ලිව් : එම්. සන්ධ්‍යා කුමාරි

DD /MA/ DA/ 09/ 050

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රයේ මගින් පවත්වනු ලබන එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විභාග අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය.

# හැඳින්වීම

දමජය වූ කලි දිනෙන් දින මොහොතින් මොහොත වෙනස් වන ප්‍රපංචයකි.එහි වෙසෙන මානවයා ද නිරන්තර සිදුවන වෙනස්වීම් හමුවේ වෙනස් වීමට භාජනය වේ.එදා මෙදාතුර වූ මේ දීර්ඝ කාල පරිච්ඡේදයේ දී සිදු වූ සමාජ පරිවර්තනය හමුවේ මිනිසුන්ගේ ජන ජීවිතය හා බැඳුණු සමාජ ආර්ථික දේශපාලනික හා සංස්කෘතික සිද්ධීන් සමුදාය ඇසුරින් ගොඩනැගුණු ජනශ්‍රැතීන් බොහෝමයක් වේ.

ජනශ්‍රැතිය යන්න න්‍යායාත්මක පදනමක් ඔස්සේ ලේඛනගත කොට තබා පවත්වාගෙන යා හැකි දෙයක් නොවේ.ජනශ්‍රැතිය යනු ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් නූතන හෝ ජන සමූහයක් අතර කාලයක් තිස්සේ මුඛ පරම්පරාගත සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාණ සම්භාරයකි. එය ගද්‍යයෙන් හෝ පද්‍යයෙන් හෝ ඒ දෙකින්ම නිර්මාණය වී පරම්පරාවෙන් පරම්පරාවට පැවත යනු දැක ගන්නට පුළුවන.මේ සියලු අර්ථකථන කැටිකොට ගත් විට ජනශ්‍රැතිය යන්න ජනයා විසින් ශ්‍රැති වහරෙන් එනම් පරම්පරාවෙන් පරම්පරාවට ඇසීමෙන් උරුම කරගත් කටවහරෙන් ආරක්‍ෂා කරගත් දැනුම් සම්භාරය ජනශ්‍රැතිය ලෙස අර්ථ දැක්වීමට පුළුවන.

ජනශ්‍රැතිය යන්න පෘතුල විෂය ක්‍ෂේත්‍රයක් වන බැවින් "වලපනේ ප්‍රදේශයේ අප්‍රචලිත ජනශ්‍රැති හා සමාජය" යන මාතෘකාව යටතේ සිදුකළ පර්යේෂණ නිබන්ධය සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගෙන ඇත්තේ වලපනේ ප්‍රදේශයයි. ජනකවි , ජනකතා, ජනආගම යාතුකර්ම ,ඇදහිලි විශ්වාස , ජනබස පිරුළු, කලාශිල්ප ආදී අංශයන් නියෝජනය කරන ජනශ්‍රැතියක් මේ ප්‍රදේශයේ ජනතාව සතුව ඇත.

මිනිසුන්ගේ දෛනික ජීවිතය හා සම්බන්ධ වූ සිද්ධි සමුදායක් සතුට, දුක ,බිය සන්තාපය මුසු වූ අවස්ථාවන් හා අත්දැකීම් ද ඇතුලත් ව සමාජ ආර්ථික දේශපාලන ආගමික, සංස්කෘතික තොරතුරු හෙළි කරන ජනශ්‍රැතී බොහෝමයකට වලපනේ ප්‍රදේශය උරුමකම් කියයි.